# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1851/1 - 2014 පෙබරවාරි මස 24 වැනි සඳුදා - 2014.02.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 49

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ නියමය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල යටතේ කටයුතු කරමින්, මෙහි උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් හා වෙළඳුන් වෙත මෙම විධානයේ පනවා ඇති කාර්ය පරිපාටිය හා අනුගතව කටයුතු කළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ :

1. අදාළ භාණ්ඩ සෑම එකකම ඇසුරුම්, බහාලුම, හෝ දවටනය මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙතින් ලබාගත් ආරක්ෂක මුද්‍රාවක් තබා ඇත්තේ නම් විනා කිසිදු භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම හෝ කරනු නොලැබිය යුතුය.

2. භාණ්ඩවලට අදාළ සෑම නිෂ්පාදකයෙකු හෝ ආනයනකරුවකු විසින්ම, එම භාණ්ඩ වෙළෙන්දන් සහ/හෝ පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සඳහා නිකුත් කිරීමට ප්‍රථම එම භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම, හෝ දවටනය මත ආරක්ෂක මුද්‍රා තබා ඇති බවට සහතික විය යුතුය.

3. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා මෙම කාර්ය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ ස්වයං ක්‍රියාකාරී උපකරණ බලයලත් සේවා සපයන්නා විසින් පමණක් නිෂ්පාදකයන්ගේ කර්මාන්තශාලා තුළ ස්ථාපනය කරනු ඇත. එම නිෂ්පාදකයන් විසින් ස්වයං ක්‍රියාකාරී උපකරණ ස්ථාපනය කිරීම සඳහා බලයලත් සේවා සපයන්නා වෙත අවශ්‍ය වන්නාවූ යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් සැපයිය යුතුය. නිෂ්පාදකයින් විසින් සාමාන්‍ය කාර්ය හා නඩත්තු කාල වේලාවන් තුළදී, උපකරණ ස්ථාපනය කිරීම හා උපකරණ ආශ්‍රිත සාමාන්‍ය නඩත්තු හා අලුත්වැඩියාවන් සඳහා, තම නිෂ්පාදන පහසුකම් කරා ප්‍රවේශවීමටද බලයලත් සේවා සම්පාදකයා වෙත අවසර ලබාදිය යුතුය.

4. ආනයනකරුවන් විසින්, එම භාණ්ඩ ශ්‍රී ලංකා වෙළඳපල වෙත මුදා හැරීමට ප්‍රථම, විදේශයෙහි සිටින විදේශීය නිෂ්පාදකයා විසින් හෝ ආනයනකරු විසින් රේගු ගබඩාවේදී, එම භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම හෝ දවටනය මත ආරක්ෂක මුද්‍රා තබා ඇති බවට සහතික විය යුතුය.


1A - PG 1982— 210 (2014/02)

සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1850/1 කාණ්ඩය 1850/55 න් අවසන් වේ.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.